ආසියාවේ පළවන ඒකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 අප්‍රේල් 30 සඳුදා
04 වෙළුම - 27 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු: 10.00

# ළමා ප්‍රදීපය



# විශ්ව දේව කැඳවීම් දිනය

## යහපත් එඬේරාණන් පසු පස යන්නට කෙරෙන ආරාධනාවයි

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# “මම ඔබ මිනිසුන් දිනන්නන් කරමි” අපේ කැඳවීම් ජීවිතයට අවනත වෙමු.

## ආදරණීය දුවේ පුතේ...

ලෝක දේව කැඳවීම් යැදුම් දිනය පසුගිය ඉරුදින අපි ඉතාමත් ගාම්භීරව පවත්වනු ලැබුවා. ලොව පුරා වෙසෙන කතෝලික ජනතාව හට මෙම කැඳවීම් යැදුම් දිනය යාච්ඤා හරිත දිනයක් සේ සලකන්නට විශේෂ හේතුන් ගණනාවක්ම බලපා තිබෙනවා. අප ශ්‍රී ලංකාව තුළත් මෙම දේව කැඳවීම් ඉරුදින ගරු ගාම්භීරව පවත්වන්නට විවිධ කටයුතු යොද තිබුණා. ඒ අනුව කොළඹ අගරදගුරු පදවියේ ලෝක කැඳවීම් යැදුම් දිනය සැමරුවේ කොටහේන ශාන්ත ලුසියා ආසන දෙව්මැඳුර තුළයි. මෙයට දසතින් විශාල සිසු සිසුවියන් පිරිසක් සහභාගී වුනා. විවිධ ප්‍රදර්ශන හා වැඩමුළු මගින් මෙම දිනය වඩාත් අර්ථාන්විත කරන්නට ඒ ඒ පදවි වල දේව කැඳවීම් අධ්‍යක්ෂ පියතුමන් බොහෝ සේ වෙහෙස මහන්සි වී තිබුණා.

ආදර දුවේ පුතේ,

ඔබට මතකද, ශු. මාක් තුමන්ගේ සුවිශේෂයේ පළමු පරිච්ඡේදයේ 16 සහ 17 වගන්ති ‘‘උන්වහන්සේ ගලීලයේ මුහුද අද්දර ඇවිදින විට සීමොන්ද ඔහුගේ සොහොයුරු ඇන්ඩෲද මුහුදෙහි දැලක් දමනු දුටු සේක. ජේසුස් වහන්සේ ඒ දැක, ‘‘ මා අනුව එන්න; මම ඔබ මිනිසුන් දිනා ගන්නන් කරමි’යි වදාළ සේක.’’මෙහි උන්වහන්සේ පවසන ‘‘මා ඔබ මිනිසුන් දිනන්නන් කරවමි’’ යන වදන් විශේෂ කොට උන්වහන්සේගේම මූලිකත්වයෙන් ඉටු කරනු ලබන කාර්යයක් බවට පත් වෙනවා. එය අපේ තෝරා ගැනීමක් නොව උන්වහන්සේ විසින් අපව තෝරා ගැනීමක් බවට පත්වෙනවා. ඒ අනුව අප ලබන දේව කැඳවීම් ජීවිතයට අපි අන්තර් ග්‍රහණය විය යුත්තේ අවංකත්වයක් මූලික කොට ගෙනමයි.

දේව කැඳවීම් ජීවිතය කියලා අදහස් කරන්නේ පූජක, පැවදි ජීවිතයට පමණක්ම ගොනු වීමක් නොවේ. එදිනෙද ජීවිතයේ සමාජ අත්දැකීම තුළ අප අත් විඳින ජීවිත රටාව අපේ කැඳවීම් ජීවිතය බවට අපි පත් කර ගන්නට ඕනෑ. විවිධ රැකියා කරන අයත් තේරුම් ගන්නට අවශ්‍ය වෙනවා, ඒ, ඒ ජීවිත වෘත්තින් සැබවින්ම දෙවියන් වහන්සේගෙන් ලබන කැඳවීමක් බව.

ආදර දුවේ පුතේ, භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේ වරක් මෙම දේව කැඳවීම් ජීවිතය පිළිබඳව අර්ථ ගන්වා තිබුනේ මේ ආකාරයෙනුයි. ‘‘සැම කැඳවීම් ජීවිතයක්ම ශුද්ධවූ සභාවට ප්‍රේම කිරීමට සහ සේවය කිරීමට යොමු කරවන අතරම, ශුද්ධවූ සභා මාතාවගේ අතිජාත මිතුරාද, එඬේරාණන්ද එහි සිරස ද වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරේ වඩා ගැඹුරුවූ ප්‍රේමයකටත් , සේවයකටත් යොමු වීමට අපව දිරි ගන්වයි.’’

එලෙස බැලූ විට ආදර දුවේ පුතේ, කැඳවීම් ජීවිතය තුළ ප්‍රේමය නැමැති ජීවිත ගුණාංග වටිනාකම අපි කුඩා අවධියේ සිටම මනාව ප්‍රගුණ කළ යුතුයි. කැඳවීම් ජීවිතයට ආදරය කරන්නා තුළ අවංකත්වය සහජයෙන්ම පිහිටා පවතිනවා. දෙවියන් වහන්සේ තුළ ඒ උතුම් ප්‍රේමය අත් විඳීම යනු සදතනිකව අපගෙන් පසුව එන අයටත් ජීවිතය සම්පූර්ණයෙන්ම භාර ගැනීමට මාවත් සූදනම් කොට පෙන්වා දීමයි. එම නිසා ශුද්ධවූ සභා මාතාවට පූජක පුතුන් හා පැවදි දියණියන් වඩ වඩාත් අවශ්‍ය වෙනවා. සියළු කැඳවීම් ජීවිතයේ ජනිත වන්නේ දෙවියන් වහන්සේ වෙතින් අප ලබන ස්වයං ප්‍රදානය අනුව බවත් සිහි තබා ගත යුතු වෙනවා. උන්වහන්සේ නොමැතිව, උන්වහන්සේගේ බලය නොමැතිව කිසිවක් අප හට කළ නොහැකියි. එම ප්‍රේමය අත් දකින්නට උන්වහන්සේ දිනපතාම අපට ආරාධනාවක් කරනවා. එයත් ජීවිතයේ උත්තරීතර කැඳවීමක් බවට පත්වෙනවා.

ආදර දුවේ පුතේ,

අනෙක් අතට දේව කැඳවීම් ජීවිතය වෙතට හා එම ඇරයුමට ජීවිත පැවැත්මෙන් පිළිතුරු දෙන්නට සූදනම් වන සියලු ඔබගේ මිතුරු මිතුරියන් ඔබ නිවැරදිව හඳුනා ගන්නට ඕනෑ. ඒ අය ඔබ තුළත් ඔබ ඒ අය තුළත් ක්‍රිස්තු ප්‍රේමය අත් විඳිනවා යන්නෙන් එළිදැක්වෙන ඒ ජීවිත පැවැත්ම වැළඳගන්නට සම්පූර්ණ සූදනමක් තිබෙන්නට ඕනෑ.

දහසය වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් මෙවර දේව කැඳවීම් යැදුම් දිනය අළලා විශේෂ පණිවිඩයක් නිකුත් කොට තිබෙනවා. එම පණිවිඩය තුළ එතුමන් පවසනවා , සැම රටකම , සැම පදවියකම ශුද්ධවූ සභා ක්‍රියාකාරීත්වය තුළ මෙම දේව කැඳවීම් අවබෝධ කර ගැනීමට විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතු බව. ඒ අනුව ඔබත් ඔබේ මීසම් සංඝය තුළ හා ඔබේ ගම තුළ මේ දේව කැඳවීම් මාර්ගය තෝරා බේරා ගන්නා ආත්මික මඟ පෙන්වන්නෙක් බවට පත්විය යුතුයි. ඔබේ පවුල් ශුද්ධවත් කරන්නට පුංචි ඔබ වඩාත් කැප වුනු ජීවිතයක් අත් දැකිය යුතුයි. ඒ අනුව ඔබේ ජීවිතය ස්වාමින් වහන්සේ කෙසේ ලියන්නට අදහස් කොට තිබෙන්නේද යන්න ඔබට නිවැරදිවම හඳුනා ගන්නට පිළිවන් වෙනවා.

එලෙසම දේව කැඳවීම් යැදුම් දිනය තුළ පමණක් නොව දිවියේ සැම දිනකම මෙම දේව කැඳවීම් තෝරා බේරා ගෙන ඇරයුම් ලත් ජීවිතය තුළ අවංකව ජීවත් වන දරු පරපුරක් වන්නට කෙරෙන මේ ආරාධනාව කිසි සේත්ම අමතක කරන්න එපා.

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා



## දහම් ගුරු සිතිවිලි

# ළමා අපිත් සැබෑ කිතුනු දිවියක් ගත කරමු

**ඔබ පොළොවේ ලුණුය. ඔබ ලෝකයේ ආලෝකයය යන උතුම් කියමන් තුළින් පැහැදිලි වන්නේ ඔබ වැනි ලූණු කැටයකින් ලෝකය තුළ රසය බෙදන්නටත්, ඔබ තුළින් දිස්වන දිප්තිය තුළින් ලෝකය ආලෝකමත් කරන්නටත් ඔබට හැකිවන ආකාරයයි. ඒ සඳහා ඔබේ පිවිතය තුළින් ක්‍රියාකරන්නට හැකිය.**

ආදර දුවේ පුතේ,

අප ප්‍රසාද ස්නාපනය ලැබූ දවසේ අප දේව තාත්තාගේ දරුවන් වුණා. ඒ මඟින් අපට දේව රාජ්‍යයේ උරුමක්කාරයන් විමට හැකිවිම පමණක් නොව තවත් ක්‍රිස්තු අනුගාමිකයෙක් විමට අපව තෝරා ගත්තා. ප්‍රසාද ස්නාපනය ලැබූ දිනයේ සිට අපට ලැබෙන වරප්‍රසාද හා ඒ මඟින් අපට ලැබෙන මඟපෙන්වීම ඔස්සේ වගකීම් ඉටුකිරීමට අවබෝධයත්, තේරුම් ගැනීමේ ශක්තියත්, අපට ලැබෙනවා.

එලෙසින්ම පසු කලෙක අභිවෘද්ධි ආලේපය ලැබිමෙන් නැවතත් අපව දේව තාත්තා කැඳවාගෙන ශුද්ධාත්මයාණන් ලබා ගෙන ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දරන්නටත්, උන්වහන්සේගේ පණිවුඩය ලෝකය තුළ බෙදන්නට ධෛර්යය හා මඟ පෙන්විමටත් උන්වහන්සේගේ හස්තයෙන් අපට නිරන්තර යෙන් ලැබෙනවා. ඔබත් කැමති ඇති ඔබ ක්‍රිස්තු ශ්‍රාවකයෙක් වන්නට එසේ නම් ඔබේ ජීවිතය ආදර්ශමත් , යහපත් විය යුතුය.

ඔබ පොළොවේ ලුණුය. ඔබ ලෝකයේ ආලෝකයය යන උතුම් කියමන් තුළින් පැහැදිලි වන්නේ ඔබ වැනි ලුණු කැටයකින් ලෝකය තුළ රසය බෙදන්නටත්, ඔබ තුළින් දිස්වන දිප්තිය තුළින් ලෝකය ආලෝකමත් කරන්නටත් ඔබට හැකිවන ආකාරයයි. ඒ සඳහා ඔබේ ජීවිතය තුළින් ක්‍රියාකරන්නට හැකිය. තමා තුළ ඇති තලෙන්තු සැම විටම කිතුනු වගකීම් වලට එකතු කරන්න ඔබට පුළුවනි.

දිදුළන සමාජයක් ගොඩ නගන්න. එවිට ඔබට සමාජය තුළින් විවිධ අභියෝග හමු වේ. ඒවාට නොසැලි ක්‍රිස්තුන් වහන්සේ වදාළ භාග්‍ය අට ආදර්ශයට ගන්න. සැමවිටම , සැම කාර්යයකදීම පළමු දෙවිදුන්ට යාච්ඤා කරන්න. එවිට උන්වහන්සේ අප සමඟ අපව දිව්‍ය සංරක්ෂණය කරයි.

පාසල තුළ , සමාජය තුළ, පවුල තුළ , සමය ඇති කරන්නෝ භාග්‍ය වන්තයෝය; යන්න ඇති කිරීමට උත්සාහ ගන්න. ඔබ තුළ පිවිතුරු සිතුවිලි ඇති කරගන්න. එවිට ඔබ තුළින් කිතුනු දරුවකුගේ වගකීම පෙන්නුම් කෙරේ.

ආදර දුවේ පුතේ, සැම ඉරිදා දිනකම දේවස්ථානයට පැමිණ දෙවිඳුන් සමඟ කතා කරන්න. ඔබ තුළ ඇති දුක් කම්කටොළු දෙවිඳුන්ට භාර දෙන්න. ඔබ සැම විටම ක්‍රිස්තු ශ්‍රාවකයෙක් වන්න. ඔබ වැනි උතුම් දරුවන් සභාවේ ඉදිරි අනාගතයට ශක්තියක්.

ක්‍රිස්තුස් වහන්සේ වදාළ 'මා අනුව එන්න. මා ඔබ මිනිසුන් දිනන්නන් කරමි.' යන්න ඔබ සිත තුළට දැඩි ලෙස අවධාරණය කරගෙන දෙවිඳුන් වෙතට හැරි ක්‍රිස්තු ශ්‍රාවකයෙක් ලෙස සත්‍යයට සාක්ෂි දරමින් සැම විටම යාච්ඤාව අවියක් කර ගෙන ඉදිරියට පියනගන්න. ඔබ කිතුනු දරුවකු ලෙස කරන ඉමහත් සේවය පසු පස ඔබව බලවත් කරනා දෙවිඳාණන් සිටියි. සැම කාර්යයකදීම ක්‍රිස්තුන්වහන්සේ ඔබේ ජීවිතය තුළත් දහම් පාසල තුළත්, පාසල තුළත් පෙන් වන්නට උත්සාහ ගන්න.

ඔබ සමිඳාණන්ගේ පුංචි තරුකැටයන්ය. ඔබ සැම විටම ලෝකය රසවත් කර දිදුළවන්න.

ඈන් සචිනි කල්පනා
ආචාර්ය මඩුල්ල
සා. ඌගෝ මුනිඳුන්ගේ
දහම් පාසල
වීරකොඩියාන
(තල්ගහපිටිය මීසම)



# ජේසුගෙන් ළමා ඔබට

**ඔබගේ ජීවිතය දෙස මොහොතක් හැරී බලන්න. දෙවි පියාණන් වහන්සේ අන් අය මගින් මහත්දේ කර ඇත. එයට ඔබ ද ස්තුති වන්ත වෙමින් කළ ගුණ සැලකිය යුතුයි. පුංචි අඩුපාඩුකම් සිදු වන විට ඒවාට මැසිවිලි කියනවාට වඩා, ඔබ ලබා ඇති හැම දෙයකටම ස්තුතිවන්ත වන්න පුරුදු වන්න.**



**දේව හඬට සවන් නොදී ක්‍රියා කිරීම නිසා පාරාවෝ වේදනාවන්ට පත් වූ සැටි අපි පසුගිය ලිපියෙන් මෙනෙහි කළෙමු.** බොහෝ දුක් පීඩා විඳ මෝසෙස් විසින් පාරාවෝගෙන් ඊශ්‍රායෙල් ජනතාව මුදා ගත්තේ ය. නමුත් මෙතරම් උදාර සේවයක් කළද, පුංචි අඩුපාඩුකම් සිදු වූ විට ඊශ්‍රායෙල් ජනතාව විසින් මෝසෙස්ට මැසිවිලි කියමින් බැන වදින්නට වූහ.

(''එවිට සෙනඟ මෝසෙස්ට විරුද්ධව කොඳුරමින් අපි බොන්නේ මොනවාදැ''යි ඇසූහ 'ඔවුහු මෝසෙස්ට හා ආරොන්ට විරුද්ධව 'මිසර දේශයේදී අපි සමිඳුන් අතින් මැරුනෙමු නම් කෙතරම් යහපත් ද? එහිදී අපට මස් පිරුණු බඳුන් ළඟ වාඩි වී ඇති තරම් කෑම කන්න පුළුවන්කම තිබිණි. එහෙත් ඔබ මේ මුළු ජනතාව සාගින්නෙන් මරා දැමීමට මේ පාළුකරයට ගෙනාවහුය'')

මේ සියළු චෝදනාවක් ම මෝසෙස් ඉවසීමෙන් දරාගෙන, සියල්ල දෙවිඳුන්ට නිහඬව ඉදිරිපත් කළේය. ඔවුන්ගේ කළ ගුණ නොදත් කමට ඔහු කේන්ති නොගත්තේ ය.

ඔබගේ ජීවිතය දෙස මොහොතක් හැරී බලන්න. දෙවි පියාණන් වහන්සේ අන් අය මගින් මහත්දේ කර ඇත. එයට ඔබ ද ස්තුති වන්ත වෙමින් කළ ගුණ සැලකිය යුතුයි. පුංචි අඩුපාඩුකම් සිදු වන විට ඒවාට මැසිවිලි කියනවාට වඩා, ඔබ ලබා ඇති හැම දෙයකටම ස්තුතිවන්ත වන්න පුරුදු වන්න. එලෙසම ඔබ අන් අයට යහපත කරන විට, පුංචි වැරදීමක් සිදු වුනොත් ඔවුන් ඔබට විරුද්ධව චෝදනා කරමින් බැන වදින්න පුළුවනි. ඔබත් මෝසෙස්ව ආදර්ශයට ගෙන සියල්ල ඉවසීමෙන් විඳ දරාගෙන ඔවුන්ගේ චෝදනා නිහඬව ජේසුට භාර දෙන්න උන්වහන්සේ ඔබට පිහිට වනු ඇත.

නික්මයාම 15/22 - 16/1-8 දක්වා මෙනෙහි කරන්න.

**ගරු. ශිරෝමා ප්‍රනාන්දු**
**පැවිදි සොයුරිය**

# ජාත්‍යන්තර තරගාවලියකදී ශ්‍රී ලංකාව නියෝජනය කළ සිසුවියක්

පසුගිය ද කොළඹ පොලිස් ක්‍රීඩාංගණයේ පැවති වයස අවුරුදු 13 න් පහළ බාලිකා දකුණු ආසියාතික පාපන්දු කරගාවලියේ දී ශ්‍රී ලංකා කණ්ඩායම තෙවන ස්ථානයට පත්විය. ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කිරීමට ක්‍රීඩිකාවක වූ මා එළිය ශා. රීටා දහම් පාසලේ 7 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩිලාෂා ඩයස් සිසුවිය වරම් ලැබුවාය. ඇය ජාඇල මීසම් සේවක ගරු ග්‍රෙගරි ජයන්ත පියතුමන් අතින් පදක්කම් පැළඳි අයුරු මෙහි දිස්වේ.

මෙම අවස්ථාවට මා එළිය නේවාසික ගරු නිහාල් රුද්‍රිගු පියතුමන්ද ඇගේ දෙමාපියන් හා දහම් පාසල් ළමුන්ද එක් වූහ. ඇය මීගමුව ආවේ මරියා විදුහලේ හත්වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන්නීය.



# හෙළ අතීත උරුමයන් විදහා පෑ ශා. ලෝරන්ස් සාහිත්‍ය දිනය



වැල්ලවත්ත ශා. ලෝරන්ස් විද්‍යාලයීය 31 වන සිංහල භාෂාව හා සාහිත්‍ය දිනය පසුගියදා පැවැත්වුණි. අපගේ සිංහල වංශ කථාවේ ඉතිහාසය තේමා කර ගනිමින් පැවති මෙය, ඉතිහාස උරුමය ශිෂ්‍ය හදවත්වලින් විතැන් වී යන යුගයක එහි වටිනාකම් තහවුරු කිරීමට ගත් වෑයමකි. ගුරු මේරි චන්ද්‍රිකා පෙරේරා පැවිදි සොයුරියගේ මඟ පෙන්වීම යටතේ, සිංහල සාහිත්‍ය සංගමයේ අනුශාසිකා නිලංකා දෙව්මිණි ගුරු මෑණියන්ගේ සහ සාහිත්‍ය සංගමයේ සිසුවියන්ගේ අප්‍රතිහත ධෛර්යයෙන් මෙය සංවිධානය කෙරිණි.

මෙදින ප්‍රධාන ආරාධිත අමුත්තාවුයේ, සමස්ත ලංකා සිංහල කවි සම්මේලනයේ හා සිංහල තරුණ කවි සම්මේලනයේ ප්‍රධාන ලේකම් ජී.එම්. අජිත් කිවිඳුන්ය. විද්‍යාලයීය ශිෂ්‍යාවන් නිර්මාණය කර ගායනා කළ පද්‍ය ගැටලුවලට එම මහතා හිටිවන කවියෙන් පිළිතුරු ඉදිරිපත් කිරීම විශේෂත්වයකි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**සාහිත්‍ය සංගමයේ සභාපති**
**දිනිති පීරිස්**

# දංකොටුව දහම් පාසල් ළමුන්ගේ භාවනාත්මක පාද නමස්කාරය



දංකොටුව උත්ථාන සමිඳුන්ගේ දහම් පාසල් ළමෝ චතාරිකය නිමිත්තෙන් භාවනාත්මක පාද නමස්කාරයකට එක්වූහ. මුරුතාන ශාන්ත අන්තෝනි මුනිඳුන්ගේ දෙව්මැඳුරේ එළිමහනේදී ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය මොවුන් සිහිපත් කළ අතර අවසානයේදී පසන් ගායනයක්ද පැවැත්වුණි.

**ටෙක්ලා කල්දේරා**
**දංකොටුව**



# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

**පසුගිය සතිය හා සබැඳේ.....**

⋆ දෙවියන් වහන්සේගේ කැඳවීමට අනුව ජීවත් වන යොවුන් වියේ පසු වන්නකු තුළ ඇතිවන ගැටලු මොනවාද?

- වැඩිහිටියන් අනවශ්‍ය ලෙස බලපෑම් කරන බව සිතීම.
- දෙමව්පියන් උදව් කළයුතු බව සිතීම
- පවතින දේවල්වල වෙනසක් වියයුතු යැයි සිතීම
- තමාගේ ශරීරය හා අන් අයගේ ශරීරයේ වර්ධනය ගැන කරදර වීම
- නිදහස
- අනාගතය ගැන පවතින සැකය

⋆ පුරාණ ගිවිසුමේ ප්‍රධාන දිවැසිවරු තිදෙනා නම් කරන්න. ● යෙසායා, ජෙරමියා, එසකියල්

⋆ දිවැසිවරුන්ට පැවැරුණු කාර්යය කුමක්ද?

- නොදියුණු යුගයක පවිටු පරිසරයක අදේවවාදී මිසදෙටු ඇදහිලිවලට යොමු වී සිටි ඊශ්‍රායෙල් ජනතාව එකම දෙවියන් වහන්සේට වන්දනා කිරීම සඳහා යොමු කිරීම. (ඒක දේවවාදය)
- දෙවි සමිඳාණන් පිළිබඳ වඩාත් ගැඹුරු අවබෝධයක් ලබාදීම
- ගිවිසුම් ජීවිතයට ඊශ්‍රායෙල් ජනතාව නැවත සමීප කරවීම / යොමු කරවීම
- මානව සමානාත්මතාවය සහ සාධාරණත්වය ක්‍රියාත්මක කරවීම
- ගැළවුම්කරුවාණන් හෙවත් මෙසියස් වහන්සේගේ පැමිණීම ප්‍රකාශ කිරීම

**ඉදිරිපත් කිරීම ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.**

⋆ පුරාණ ගිවිසුම තුළ අලුත් ගිවිසුමක් පිළිබඳව කථා කරන දිවැසිවරයා කවුද?

- ජෙරමියා (ජෙරමියා සඳහන් කරන මෙම අලුත් ගිවිසුම වූ කලී ක්‍රිස්තුන් වහන්සේ ය )

## නිවැරදි අවබෝධයෙන් දෙවන තේමාව පටන් ගනිමු.

⋆ දේව ප්‍රසාද නිධානයක් යනු කුමක්ද?

- ඇතුළතින් අප වෙත දානය කරනු ලබන දේව වරප්‍රසාද පිටස්තර වශයෙන් සලකුණු කෙරෙන අයුරින් ස්ථාපිත කර ඇති සංඥා පිළිවෙත් නිධාන වේ.
- දෙවියන් වහන්සේගේ ආදරය ප්‍රකාශ කරන සංකේත හා සලකුණු, දේව ප්‍රසාද නිධාන නම් වේ.
- ප්‍රසාද නිධාන ජේසුස් වහන්සේ විසින් ස්ථාපිත කරන ලද අප ආත්මයට වරප්‍රසාද ලබාදෙන්නකි.
  උදා: ජලය වත් කිරීම - පාපයෙන් පවිත්‍ර වීම - නව ජීවිතය
- බාහිර සලකුණු මගින් කරන ඇතුළාන්ත වරප්‍රසාද දානය, ප්‍රසාද නිධානයක් වේ.

⋆ වර්තමාන ජනවන්දනාව හා සම්බන්ධ දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ප්‍රධාන මූලාශ්‍රය කුමක්ද?

- ජනවන්දනාව පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව
  SACROSANCTUM CONCILIUM - සක්‍රොසාන්ක්ටූම් කොන්චිලියුම්

**ලබන සතියට .....**

# ළමා හා යොවුන් ලේඛක වැඩමුළුවක් නයිනමඩමේදි ......

(මැක්ෂිමස් රෝයි පෙරේරා විසිනි)

''දෙවිඳුන් දුන් තලෙන්තු ජනතාවට ලබාදෙමින් ජාතික කතෝලික ලේඛක හවුල සිදුකරන මෙහෙය මා අගය කරනවා. මෙයින් ලබා ගන්නා සේවය රටේ යහපත තකා මෙහෙයවීමට අප ලේඛක සහෝදරයන්ට හැකිවේවායි ප්‍රාර්ථනය කරන බව නයින මඩම මීසමේ සහයක පිය ගරු විරාජ් නිලංග පියතුමා ප්‍රකාශ කළේය.



සංවිධානය කරන ලද යොවුන් , ළමා වැඩමුළුවේ ආරම්භක කථාව කරමිනි.

ගරු පියතුමන් මෙසේ පැවැසුවේ නයිනමඩම සා. මරියා විදුහලේ ජාතික කතෝලික ලේඛක හවුල විසින්




ගරු ලයිලි ප්‍රනාන්දු නයිනමඩම මීසම්පති පියතුමා ප්‍රමුඛ සමිඳු හඬ සංවිධානයේ ඩැනිසියස් ප්‍රනාන්දු , නිමල් ප්‍රනාන්දු , සුරේෂ් පෙරේරා , සුපෙම් වන්නි ආරච්චි , රෝසි ප්‍රනාන්දු මිය ඇතුලු මීසම් වැසියන් විසින් සංවිධානය කරන ලදි.

ජාතික කතෝලික ලේඛක හවුලේ කපිතාන් ඇන්ටන් ජයකොඩි , කැලිස්ටස් ජයමාන්න , ජයන්ත පලිහවඩන, ජෝ සංගපාල ආරච්චි , හිල්ඩා බාලසූරිය හා නීතිඥ ජෝශප් ප්‍රනාන්දු පුල්ලේ මහතුන් විසින් මෙහෙයවන ලද අතර , ජාතික කතෝලික ලේඛක හවුලේ සභාපති පීටර් කැනියුට් පෙරේරා , ලේකම් මැක්ෂිමස් රෝයි පෙරේරා පද්මිණි විජේතුංග , සහභාගි වූහ. සහභාගි වූ දරු දැරියන්ට වටිනා සහතික පතක්ද ප්‍රදානය කරන ලදි. පාඩම් අළලා ඉදිරිපත් කරන ලද ප්‍රශ්න වලට පිළිතුරු දුන් දරුදැරියන්ට පොත් ප්‍රදානයක්ද සිදු කරන ලදි.

## ස්වාධීන රූපවාහිනියේ 'සුදත් මඟ' කිතුනු වැඩසටහනට හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ (ස්වදේශී සේවය) ''කිතුනු ළමා හමුව '' ට නිර්මාණ යොමුකරන්නට ළමා ඔබටත් අවස්ථාවක් !

**ළමා ඔබගේ නිර්මාණයන්** ඔබේ නම, ශ්‍රේණිය, පාසල, දහම් පාසල, දුරකතන අංකය ඔබ අයත් මීසම, පදවිය ආදී තොරතුරුද ඇතුලත් කර **පහත ලිපිනයට යොමු කරන්න.**

**ළමා ප්‍රදීපය ''සුදත් මඟ''**
**ළමා නිර්මාණ අංශය**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**කොළඹ 08.**

**''කිතුනු ළමා හමුව''**
**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව**
**කොළඹ 07.**

(සංස්කාරක පියතුමා)

## ඔබ එළිදක්වන පොත්පත් වලට අපෙන් ඉඩක් ...

ඔබ පාසලේ, මීසමේ දහම් පාසලේ එළි දක්වන, ළමා පොත්, සඟරා හා පුවත් පත් පිළිබඳව තොරතුරු අපට ලියා එවන්න. ඒවා ළමා ප්‍රදීපයේ පළ කිරිමට අපි සූදානම්. එම විස්තර පහත ලිපිනයට යොමු කරන්න.

**''පොත් පත්''**
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත -
කොළඹ 08

# දිව බොදුනින්



**මලිතා ලොකු බාලසූරිය**
05 ශ්‍රේණිය
ශු. පවුලේ කන්‍යාරාමය
බම්බලපිටිය

**ලක්ෂාණි රංගිකා**
07 ශ්‍රේණිය
ශු. අන්තෝනි මුනිදුන්ගේ
දහම් පාසල - වැලිවේරිය



**රිනිෂ්මා ශේනිකා**
07 ශ්‍රේණිය
සා. ජෝශප් විදුහල
මීගමුව ශාඛාව

**රවිඳු නිලම්බර**
06 ශ්‍රේණිය
ගොන්සාල්වේස් මහා
විදුහල
පමුණුගම







**දිලුන්යා ද මෙල්**
04 ශ්‍රේණිය
ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය
කොළඹ 07

**ට්‍රෙවෝන් ශෙනන්**
05 ශ්‍රේණිය
මාරිස් ස්ටෙලා විදුහල
මීගමුව





**එරංගි දබරේරා**
04 ශ්‍රේණිය
ශු. පවුලේ බාලිකා ප්‍රාථමික විදුහල
මාරවිල

# පෝෂණය වෙමු

## පුංචි අපේ චිත්‍ර පිටුව

**දිල්කි තත්සරනි**
04 ශ්‍රේණිය
ශා. තෙරේසා දහම් පාසල
තිඹිරිගස්යාය







**අකිල සඳරුවන්**
07 ශ්‍රේණිය
ශා. අන්තෝනි දහම් පාසල
කදිරාන

**සංජනා ප්‍රනාන්දු**
04 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල
මාරවිල






**සඳලි ගිත්මා ප්‍රනාන්දු**
05 ශ්‍රේණිය
ශු. පවුලේ දහම් පාසල
මණ්ඩකොණ්ඩාන

**අංජලා නිලන්ති**
04 ශ්‍රේණිය
ශා. ජෝශප් ළමා නිකේතනය
හිඟුරක්ගොඩ




**සඳලි තාරකා**
07 ශ්‍රේණිය
ශු. අසීසි ෆ්‍රැන්සිස් දහම් පාසල
උඩුගම්පල






**සාවින්ද නිරාශ්**
02 ශ්‍රේණිය
සාන්ත සේවියර් දහම් පාසල
තල්ගහපිටිය

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ)
# සිසු සිසුවියන් සඳහා



General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

**ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.** **පාඩම් අංක : 51**

**පසුගිය සතියේ ප්‍රශ්න සඳහා පිළිතුරු**

**both / either** හෝ **neither** යොදා සම්පූර්ණ කරන්න.

1. Do you want tea or coffee?
   I don't mind **either**
2. What day is it today? Monday or Tuesday?
   **Neither** . Today is Wednesday. ඒ එකක්වත් නෙමේ. අද අඟහරුවාදා.
3. What shall I eat? Bread or rice?
   Take **either** .
4. Whom did you meet yesterday? Kamani or Rani?
   I met **both** .
5. When shall I phone you? Morning or evening?
   **Either** .You can call me anytime.
6. Where is your father? Is he at work or home?
   **Neither** . He has gone to Colombo.

**both / neither / either** යන වචන සමඟ අවශ්‍ය නම් පමණක් **of** ද

යොදා හිස්තැන් පුරවන්න.

7. **Both** my brothers are studying.
8. You can take a bus, or you can go by train.
   You can go **either** way.
9. I tried to call you twice. But **both** times you were out.
10. He has two sisters. But **neither** of them is studying.
11. There was an accident. Two cars have collided. But **neither** driver was
12. injured. But 12. **both of the** cars were damaged.
13. I have two brothers. **Both of** them are studying.

**Both of us/ them, Either of us/ them, Neither of us / them** යොදන්න.

14. I asked two people the way to the station.
    But **neither of them** knew.
15. I was invited to two parties but I didn't go to **either of them.**
16. There were two windows in the room. I opened **both of them.**
17. Sunil and I play tennis. But **neither of us** can play very well.
18. I tried two bookshops for a novel. But .**neither of them** had it.

**neither / either / none / any**. යොදා සම්පූර්ණ කරන්න

19. I bought five books but didn't read **any** of them.
20. I bought two books but didn't read **either** of them.

# ළමා ප්‍රදීපය කැමරා කාචයේ සටහන් වූ සිඟිති අවුරුදු උළෙල



මග්ගොන සාන්ත විසෙන්ති නිවාසයට අයත් දියලගොඩ ධර්මරත්න ජනපදයේ පෙර පාසලේ වාර්ෂික ක්‍රීඩා උළෙල දියලගොඩ දොන් බොස්කෝ ළමා නිවාසයේ අධ්‍යක්ෂ, ගරු ඇන්තනි මාකස් සහෝදරතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පැවත්වුණි.

පොල්තෙල් පහන දල්වන මෙහි අධ්‍යක්ෂ ගරු ජෝන් ගිල්බට් නි.ම.නි සහෝදරතුමන්, දරු දැරියන් තරගයකට සහභාගිවන අයුරු දැක්වේ.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු.



පමුණුගම යහපත් එඬේරා ළදරු පාසල සංවිධානය කළ පාස්කු හා සිංහල අවුරුදු උළෙලේදී සිඟිති අවුරුදු කුමරා හා සිඟිති අවුරුදු කුමරිය ලෙස තේරී පත්වූ ළමුන් දෙදෙනා සේයා රුවෙන් දැක්වේ.

බෙන්ජමින් කිරිහෙට්ටි

කලමුල්ල මීසමේ කුඩා මල කන්‍යාරාමයේ පෙර පාසලේ වාර්ෂික සිඟිති බක්මහ උළෙල මෙවරද පෙර පාසල් පාලිකා ගරු ශානිකා පැවිදි සොහොයුරියගේ හා ආචාර්ය මණ්ඩලයේ මෙහෙයවීමෙන්, මීසම් පාලක ගරු මොරිස් නාමල් , සහයක ගරු රුවන්ත කුමාර ප්‍රනාන්දු යන පියතුමන්ලාගේ සහ කටුකුරුන්ද කන්‍යාරාමයේ ගරු ත්‍යාගා ප්‍රධාන මව්තුමියගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පෙර පාසල් භූමියේදී පවත්වන ලදී.

(ඇන්ටනි ප්‍රනාන්දු )



## ආදර දේව අම්මා

චනෝද් රියෙන්දික
10 ශ්‍රේණිය
පාතිමා දහම් පාසල
මල්කඩුවාව
(කුරුණෑගල මීසම)

## සුව සහනය ඔබයි සමිඳුනේ



මට දුරස් වෙන්න බෑ
ඔබේ ආදරෙන්
මා පව් කෙරුවා මට දැනුනා
කෙදිනක හෝ ඔබ එනතුරා
මා දෙනෙත් මඟ බැලුවා
අද මා අබියස හිඳ
ඔබයි සෙව්වේ මාගේ ජේසු
ඔබයි මගේ සුව සහනය
සදා මාගේ ජේසුනි ........

එස්.ජී. ශකලා මධුෂානි
12 ශ්‍රේණිය (කලා) -
ලූර්දු මාතා සිද්ධස්ථානය , නාත්තන්ඩිය

# කුරුණෑගල හා මල්කඩුවාව දහම් ළමුන්ට ලේඛන වැඩමුළුවක්

කුරුණෑගල සා. ආනා හා කුරුණෑගල මීසමට අයත් මල්කඩුවාව පාතිමා දේව මාතා දහම් පාසලේ ළමුන් සඳහා කුරුණෑගල ශු. පවුලේ බාලිකා මහ විදුහලේ හා මල්කඩුවාව පාතිමා දෙව්මැඳුරෙහිදී ළමා ලේඛක වැඩමුළුවක් පසුගියදා පැවැත්වුණි. 6 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය දක්වා ළමෝ මීට සහභාගී වූහ. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. මීට එක්වූ ළමුන් ජනසන්නිවේදනය , පුවත්පත් කලාව හා නිර්මාණකරණය පිළිබඳව දැනුවත් කෙරිනි. ළමුන් හට ලේඛන අභ්‍යාසයක්ද ලබා දුන් අතර ඉන් සාර්ථක නිර්මාණයක් ළමා ප්‍රදීපයෙහි පළකිරීමට කටයුතු යෙදීම පැසසිය යුතු අතර එය ආධුනික ලේඛක පිරිසට දිරි දෙන මහගු අවස්ථාවකි.



ළමා ප්‍රදීපය ප්‍රහේලිකා අංක 29 ජයගත් සිසුවාට ත්‍යාගයක් ලබා දුන් අයුරු

වැඩමුළුව අතරතුරදී ළමා ප්‍රදීපය ප්‍රහේලිකා අංක 29 ජයග්‍රහණය කළ මල්කඩුවාව පාතිමා දේව මාතා දහම් පාසලේ 9 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශනිල්ක ප්‍රනාන්දු සිසුවාට ත්‍යාගයක් දේශක කුමර නයනජිත් මහතා අතින් ලබා දුනි. මේ සඳහා දයක වුයේ ආචාර්ය මඩුල්ලේ ජෙරි සෙනවිරත්න මහතාය (මල්කඩුවාව ප්‍රදීපය අලෙවි නියෝජිත)



පුවත්පත් කලාව පිළිබඳ දෙසුමේ අභ්‍යාසයේ අවස්ථාවක්

කුරුණෑගල මීසම් සේවක ගරු ජෙරොම් පෙරේරා මීසම් සහයක ජාමික සුමේද යන පියතුමන්ලාගේ මඟපෙන්වීම යටතේ මෙය සංවිධානය කෙරිනි.

**සේයා හා සටහන : ශානක මුහන්දිරම්**

---

**මාසික සිතිවිල්ල**



මෙහි පළවන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමග ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.

**මාසික සිතිවිල්ල**
"අප්‍රේල් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.




# දේව අම්මා අපේ අම්මා කරගනිමු



ආදර දුවේ, පුතේ. ඔන්න ඉතින් දැන් පාස්කු කාලයත් ඉවරයි. පාසල් නිවාඩු කාලයත් ඉවරයි. දැන් අලුත් පාසල් වාරයක් ආරම්භ වෙලා. දැන් අපි ඉන්නේ මැයි මාසයේ, මැයි මාසය මල් මාසයයි. මල් මාසය දේව අම්මාගේ මාසයයි. මේ මාසයේ අපි වැඩියෙන්ම දේව මෑණියන්ට ගෞරව කර. මැයි මංගල්ල පවත්වන කාලයක්, ගෙවල් ගානේ දේවමෑණියන්ගේ ප්‍රතිමාව රැගෙන යනවා. ජපමාලය උච්චාරණය කරනවා. මේ වගේ ගොඩක් භක්ති අභ්‍යාසයන් පවත්වනු ලබනවා. ඉතින් ආදර දුවේ, පුතේ, මේ කාලයේ ඔබ මොනවද කරන්න හිතාගෙන ඉන්නේ. වෙන මාස වගේම මේ මාසයත් නිකම්ම ගත කරනවාද?
මේ මාසයේ විශේෂ යමක් කරන්න උත්සාහ ගන්න. දේව අම්මාට ගෞරව කරන ගමන්ම ඔබේ අම්මා ගැනත් වැඩියෙන් හිතන්න. අම්මා ඔබ වෙනුවෙන් කරන කැපවීම අගය කරන්න. ඔබ වෙනුවෙන් ඔබේ අම්මා කොච්චර පරිත්‍යාග වෙනවාද? මහන්සි වෙනවාද? කියලා හිතන්න. එයට අඩිතාලමක්
වශයෙන් මම ඔයාලට පුංචි කතාවක් කියන්නම්. ඔන්න දවසක් අම්මා කෙනෙකුයි දරුවෝ දෙන්නෙකුයි කැමක් නොගෙන ගමන් කළා. අවසානයේදී සවස තමයි මේ අම්මාට පාන් ගෙඩියක් හම්බ වුනේ. මේ අම්මාට පාන් ගෙඩිය ලැබුණ ගමන්ම ඒක දෙකට කඩලා තම දරුවන් දෙන්නාට දෙනවා. මේක මිනිස්සු දෙන්නෙක් බලාගෙන ඉන්නවා. එක මනුෂ්‍යයෙක් කියනවා මේ අම්මාට බඩගිනි නැති පාටයි. ඒකයි පාන් ගෙඩිය දෙකට කඩලා දරුවෝ දෙන්නට දුන්නේ කියලා. නමුත් අනිත් මනුෂ්‍යයා කියනවා නෑ. දරුවන්ට වගේම මේ අම්මාටත් බඩගිනි දැනෙනවා නමුත් දරුවන්ගේ කුස පිරෙනවා දැකලා මේ අම්මා සතුටු වෙනවා කියා.

ආදර දරුවෙනි, ඔබේ අම්මා ගැනත් ඔබ කියන්නේ මේ විදිහටද? ඔබේ සතුට දිහා දැකලා ඔබේ අම්මා කොච්චර සතුටු වෙනවා ඇද්ද? ඔබට මේ ගැන තේරෙනවාද? ඔබව අද මේ තත්ත්වයට පත් කරන්නට ඔබේ අම්මා කොතරම් වෙහෙස මහන්සි වෙන්න ඇද්ද? අද ඔබ ලොකු මහත්වී හිටියත් පුංචි කාලේ අම්මාගේ පරිත්‍යාග මොනතරම්ද? දස මසක් කුසේ තියාගෙන තමාගේම ලේ කිරට හරවලා පොවලා නොවේද ඔබව ලොකු මහත් කළේ. ඔබේ කැතකුණු ඇයට කවමදාවත් පිළිකුල් වුනේ නෑ නේද? රෑ නිදි මරාගෙන ඔබව නිදිකරවන්න ඇති නේද? අම්මා දන්කුඩ බත් සහ මාළු ඔළුව කාලා ඔබට හොඳ බත් සහ හොඳ මාළු කැල්ල දෙන්න ඇති නේද? අද මේ හැමදෙයක්ම ඔබට අමතක වෙලා නේද? ඇයි ඔබ අම්මත් එක්ක එකට එක කියන්නේ. අම්මාගේ ආදරයට වඩා වෙන ආදරයක් හොයාගෙන යන්නේ. ජේසු හැදී වැඩුණේ දේව අම්මාගේ උණුසුමෙන්. සමහර දරුවෝ අම්මාට හරියට බොරු කියනවා. තමාගේ අම්මාට වේදනා දෙනවා. ළඟදී යාළුවුන කොල්ලව ලොකු කරගෙන අම්මාව අඬවනවා. ඔබේ මංගල ඇඳුම දැම්ම මහන්න එපා. ආදර දුවේ, පුතේ, ඔබ ලොකු වුනාම ඒක ඔබට හිර වෙනවා. ඒ පරණ විලාසිතාව අනාගතයට ගැලපෙන්නේ නෑ. ඒ නිසා කාලය එනකම් ඉවසන්න. අම්මාගේ කැපවීම පෙන්නන මේ ගීතිකාව කියවලා මෙනෙහි කරමු. සාගරයටත් වඩා ගැඹුරුයි

ආදරය ඔබගේ අම්මේ අම්මේ ආදරය ඔබගේ //
දරුවෝ ටික යහතින් සිටිනම් ඔබගේ සැපත එයයි.
එකකු හෝ දුක මැද සිටිනම් ඔබේ සිත එතැනයි.
ඔබේ සුව සැප නොවේ සිතුවේ දරුවෝ ගැනම තමයි
දරුවන්ගේ දරුවන්ගේ දරුවන් හටත් අම්මා ඔබයි.

දැන් ආදර දුවේ, පුතේ, පොත අරගෙන ඔබ වෙනුවෙන් ඔබේ අම්මා කරපු කැපවීම් ලියන්න. ඔබට මතක ඇති කාලයේ ඉඳන් මේ වෙනකම්, ඊට පස්සේ අනිත් පැත්තේ ඔබේ අම්මා වෙනුවෙන් ඔබ කළ දේවල් මොනවාද කියලා ලියන්න.
අම්මාගේ කැපකිරීම්, මගේ යුතුකම් සහ මා කළ දෑ දසමස කුසේ තබා ගැනීම, මම ආදරෙයි අම්මේ කීම. ලේ කිරට හැරවීම අම්මාව ආදරයෙන් සිප ගැනීම

මේ ආකාරයට ඔබත් සටහනක් අඳින්න. ඒක ඉවර වුනාම ඒක ලස්සනට හදලා ඔබේ අම්මාගේ උපන් දිනය දවසේ, තෑග්ගක් හැටියට දෙන්න. එහෙම නැතිනම් මැයි මංගල්ලය දවසේ දෙන්න. මේ දවස්වල වැඩියෙන් කොන්තේ කියන්න. ඔබේ අම්මාව දේව අම්මාට බාර කරන්න. ඔබත්, දේව අම්මා ඔබේ අම්මා කරගන්න. ඔබ සැමට මරි මව්ගේ රැකවරණය බහුලව ලැබේවා.



# සිසු නායක පදක්කම් පැළැඳවීම

**දියලගොඩ සා. සෙබස්තියන් දහම් පාසල**



දියලගොඩ සාන්ත සෙබස්තියන් දහම් පාසලේ ශිෂ්‍ය නායක නායිකාවන් හට පදක්කම් පැළඳවීමේ උත්සවය පසුගිය ද මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරින.

සාන්ත සෙබස්තියන් දහම් පාසලේ ගරු විදුහල්පතිනිය ඇතුළු දහම් ගුරු මණ්ඩලය එක්ව මෙය සංවිධානය කළහ. දේව මෙහෙය අවසානයේදී ගරු පියතුමා , ශිෂ්‍ය නායක නායිකාවන් ළමා ප්‍රදීපය සඳහා කැමරාවට මුහුණ දුන් අයුරු. **(ඩී . ඇන්සලම් ප්‍රනාන්දු )**

● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ●




බප/මීග/ වැවල සාන්ත ක්ෂේවියර් මහ විදුහලේ 2012 වසරේ ශිෂ්‍ය නායක නායිකාවන්ට පදක්කම් පැළඳූහ. කඳාන සාන්ත සෙබස්තියන් බාලිකා මහ විදුහලේ විදුහල්පතිනි ගරු මරියා ගොරෙට්ටි පැවිදි සොහොයුරිය , අගරදගුරු පදවි කතෝලික පාසල් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ගරු නිලන්ත හේෂාන් පියතුමා මෙදින ශිෂ්‍ය නායක නායිකාවන්ට ලාංඡන පැළඳවීම. පදක්කම් ලැබූ සිසු නායක නායිකාවන් සේයාරුවෙහි දිස්වේ.

**( ලෝරන්ස් ප්‍රනාන්දු / ලෙස්ලි පෙරේරා )**

# ප්‍රහේලිකා අංක 30

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | | 2 | | ■ |
| | ■ | ■ | | ■ | ■ |
| 3 | | ■ | 4 | | 5 |
| ■ | ■ | 6 | ■ | ■ | |
| 7 | | | | ■ | |
| | ■ | | ■ | ■ | |

**( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )**

හරහට

1.''අනුන් විනිශ්චය නොකරන්න. එවිට ඔබත් ............................ කරනු නොලැබේ. යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

3. නාස්තිකාර පුත්‍රයාගේ උපමාවේ බාල පුතා පසුතැවිලි වී ගෙදර ගිය පසු කරුණාවන්ත පියා ඉතා සංතෝෂ වී ඔහුව පිළිගෙන ......................... කළ වස්සා මරා භෝජන සංග්‍රහයක් පිළියෙල කළේය. හිස්තැනට සුදුසු වචනය

4. ඊශ්‍රායෙල් ජනතාව ගනුදෙනු කරන්නන් රවටන හොර ................... පාවිච්චි කරන බව පවසමින් අමොස් දිවැසිවරයා චෝදනා නැගුවේ ය. හිස්තැනට සුදුසු වචනය

7. දෙවියන් වහන්සේ මෙම දිවැසිවරයාව කැඳවුයේ ඔහු කුඩා කාලයේදීමය.

පහළට

1. ක්‍රිස්තුන් වහන්සේ කන්ද උඩ දේශනයේදී සැපත හා ........................... මෙය පිළිබඳව දේශනා කළ සේක.

2. ''මුලා නොවන්න නරක ආශ්‍රයෙන් හොඳ ............................. . නරක් වන්නේය'' යනුවෙන් ශු. පාවුළු තුමා පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ''මසුන් අල්ලන පිණිස .................... ගොස් දැල් හෙලන්නැ''යි ක්‍රිස්තුන් වහන්සේ සීමොන්ට වදාළ සේක මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ''වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න. ''යනුවෙන් මෙම දිවැසිවරයා තුළින් දෙවියන් වහන්සේ අපට ආරාධනා කරන සේක.

07. ආබ්‍රහම් තුමාගේ බිරිඳගේ නම ................

**(මෙම ප්‍රහේලිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ලූක් 5/4, 6/37, 6/20, 15/30 , ආමොස් 7/4-6 , 1 සාමුවෙල් 3, උත්පත්ති 18, 1 කොරින්ති 15/ 33, ජෝවෙල් 2/13)**


කුඩා මේරි... මාමව හම්බවෙන්න වවුමෙ තියෙන එයාගෙ ගෙදරට ගියා... ඒක මහා විසාල ගෙයක්
3
කතාව සහ චිත්‍ර..
අනේ මාමේ අම්මයි.. තාත්තයි මැරුණු නිසා මට ඉන්න තැනක් නෑ මං මෙහෙ මාම ළඟට ආවා.. මට මෙහෙ ඉන්න දෙනවද ..?
හා.. හා.. වරෙං ළමයා ගෙට.. අපිත් මේ ගෙදර වැඩට කෙනෙක් හොය හොය හිටියෙ.. දැං ඒකත් හරි..
ඒ මාම හරිම නපුරෙක්.. නැන්දත් ඒ වගේ හරිම ලෝබයි... ඒ ගොල්ලො කුඩා මේරිව එහෙ නවත්තගෙන.. පුළුවන් තරම්.. වැඩ ගත්තා..
ඉක්මං කරල වැඩ කරපං ....ළමයා...
ඔය දර ටික පළලා, වතුර ගෙනල්ලා හාල් ටික පුරෝලා... ගඟට ගිහිං රෙදි ටික හෝදගෙන එන්න ඕනි.. හොඳද...
ශීත කාලය උදාවුනා.. ගස්, වැල්, මල්, කඳු හිමෙන් වැසීගියා...
කොච්චර සීතල තිබුනත් මේරිට නම් නිදහසක් නෑ.. ඒ ගොල්ලො සීතලට පොරවගන්න කබායක්වත් එයාට දුන්නෙ නෑ...
-පාලිත-

ශුද්ධ ලියැවිල්ලේ දිවැසිවර චරිතාපදාන ළමා ප්‍රදීපය ඔබ වෙත රැගෙන එයි

හත්වන කොටස

සැකසුම : තිළිණ අලහකෝන්

# දිවැසිවර එලියා

